# 2018 පැසිෆික් සහයෝගිතාව

## සමාරම්භක දේශනය

රොබර්ට් හිල්ටන්
නියෝජ්‍ය ප්‍රධානී
එක්සත් ජනපද තානාපති කාර්යාලය
2018 අප්‍රියෙල් 25

අද්මිරාල් ආටිගල, අද්මිරාල් ඩි සිල්වා, කපිතාන් බ්‍රෙට්ස්, කපිතාන් රොබට්ස්, රජයේ නිලධාරීන්, සහෘදයිනි , දෙමාපියනි, මිත්‍රවරුනි ඔබ සැමට සුභ සන්ධ්‍යාවක්. ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති අතුල් කෙශප් සහ කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සියලුම දෙනා වෙනුවෙන් යූඑස්එන්එස් මර්සි (USNS Mercy) නෞකාවේ සියලුදෙනා මා ඉතා සාදරයෙන් පිළිගන්නවා. ඔබගේ පැමිණීම පිළිබඳව අපි ඉතා සතුටට පත්වෙනවා. ශ්‍රී ලංකාවේ ඔබ ගතකරනු ලබන කාලය අමතක නොවන සහ වඩාත් ඵලදායී එකක් වන බවට මම විශ්වාස කරනවා. ශ්‍රී ලංකාවේ දී පවත්වනු ලබන පැසිෆික් සහයෝගිතා දෙවන අභ්‍යාසයේ සමාරම්භක අවස්ථාවට සම්බන්ධවීමට හැකිවීම පිළිබව මා ඉතා ප්‍රීතියට පත්වෙනවා.

යූඑස්එන්එස් ෆෝල් රිවර් (USNS Fall River) නෞකාව දකුණේ හම්බන්තොට වරායට පැමිණ 2017 පැවැත්වූ පැසිෆික් සහයෝගිතාවයෙන් පසුව ලබාගත් කැපීපෙනෙන සාර්ථකත්වයෙන් අනතුරුව මෙවර පැවැත්වෙන අභ්‍යාසයන් මීට පෙර ඒවාටත් වඩා වඩාත් ශක්තිමත් හා පුලුල් ස්වරූපයක් ගනු ලබන බවට මා හට විශ්වාසයි.

ඒ වාගේම 2016 වසරේදී යාපනය ප්‍රදේශයේ දී පැසිෆික් ඒන්ජල් නෞකාව සමගින් ලබාගත් ජයග්‍රහනයන්ද මෙයට අපට මහත් පිටිවහලක් වනු ඇත. එක්සත් ජනපදයේ පැසිපික් බල ඇණියට, ශ්‍රී ලංකා යුධ හමුදාවට සහ මර්සි නෞකාවේ කාර්යය මණ්ඩලයට ඉතාමත් ස්තුතිවන්ත වන අතර ඔවුන් නොසිටියේ නම් මෙම අභ්‍යාසයන් පැවැත්වීමට නොහැකිවනු ඇත.

2018 වසරේදී ශ්‍රී ලංකාව නිදහස ලබා 70 වසරක් සමරන අතරම ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර තානාපති සම්බන්ධතාවන්ටද 70 වසරක් සපිරේ. කෙසේ වෙතත් අප

දෙරට අතර සම්බන්ධතා මෙයටත් වඩා අතීතයට දිවයයි. ඇමෙරිකානු රජයේ ආරම්භක සමයේදී නව එංගලන්ත නැවියන් නාවික සේවාවන් ලබාගැනීම සඳහා ගාල්ල වරායට පැමිණියහ. එසේම 19 වන සියවසේදී මාක්ට්වේන් වැනි ගවේශකයින් සහ ඇමෙරිකානු මිෂනාරිවරුන් ශ්‍රී ලංකාවට පැමිණියහ. මොවුන්ගෙන් සමහරු සංචාරයකයන් වූ අතර සහ සමහරු ශ්‍රී ලංකාවේ නිත්‍ය පදිංචිකරුවෝ වූහ. ඔවුන් සියලු දෙනාම අපගේ දෙරට අතර මිත්‍රත්වයට නොමැකෙන සටහන් තැබූහ. පැසිෆික් පාර්ශවකරණය මෙම වංශකතාවේ නවතම පරිච්ඡේදය ලියනු ඇත. පසුගිය වසරේ පැවැති අභ්‍යාසයන්හි අත්දැකීම්ද සමගින් මේ වසරේ පැසිෆික් සහයෝගිතා අභ්‍යාසයන්හිදී ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය අංශය, මානුෂීය ආධාර ලබාදීම සහ ආපදා සහන සැලසීම හා ප්‍රජා සම්බන්ධතා යන වැදගත් අංශ කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

මෙම අභ්‍යාසයන් මගින් සිදුවූ බලපෑම අතිශයින් වැදගත්ය. මෙම අභ්‍යාස මගින් අදහස් සහ යහ භාවිතයන් හුවමාරු වීම පමණක් නොව මේවාට සහභාගීවන්නන් අතර වෘත්තීයමය සහ පෞද්ගලික සම්බන්ධතාවයන් වර්ධනය කරන වාතාවරණයන් ගොඩනැංවීමට අතිශයින් උපකාරීවී ඇත.

මෙවර අපගේ නාවිකයින් පාසල් සහ සායන ගොඩනංවමින් ශ්‍රී ලාංකිකයින් සිය ගණනකට සෞඛ්‍ය සත්කාර ලබාදෙනු ඇත. ඒ වාගේම ඔවුන් ශ්‍රී ලාංකික වෘත්තීකයින් සමගින් ඔවුන්ගේ ප්‍රවීණත්වයන් බෙදාහදාගන්නා අතර එමගින් අනාගතයේදී තව බොහෝ දෙනෙකුට ප්‍රතිලාභ අත්වනු ඇත. එසේම ඔවුන් ජාතීන් අතර සහයෝගීතාවය සහ ජාතීන අතර පාර්ශවකරණයන්ට ශක්තිමත් පදනමක් දමනු ලබන සම්බන්ධතාවයන් ගොඩනංවනු ඇත. මෙවර සිදුකිරීමට සැලසුම් කර තිබෙන වැඩසටහන් 36 මීලඟ දෙසතියක කාලසීමාව ඇතුළත සිදුවනු ඇත. පැසිෆික් පාර්ශවකරණය යටතේ ආපදා ප්‍රතිචාර සැලසීම සහ මානුෂීය සහන සැලසීම පිළිබඳ අභ්‍යාසයක්ද පවත්වනු ඇත. බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියා, කැනඩා සහ පෙරුවියන් පාර්ශවකරුවන්ද මෙයට සම්බන්ධවීම මගින් මෙය අන්තර්ජාතික කටයුත්තක් බවට පත්වනු ඇත. විවිධ ජාතීන් එකට එක්ව සිදුකරන්නාවූ ශක්තිමත් ප්‍රයත්නයක් මගින් ඵලදායී ආකාරයට ආපදා සහන ප්‍රතිචාර දැක්වීමට හැකිවනු ඇත.

අපගේ යුද්ධ හමුදාවන්ට එකිනෙකා සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ හැකියාවද සමගින් මෙම අභ්‍යාසය මෙම කළාපයේ ආරක්ෂාව වෙනුවෙන් පවත්නා අපගේ පොදු වගකීම්ද එය සාර්ථක කරගැනීම සඳහා අපගේ දායකත්වයද සනිටුහන් කරනු ඇත.

පැසිෆික් සහයෝගිතාව සංහිඳියාව, සෞභාග්‍ය සහ ආරක්ෂාව තහවුරු වූ ශ්‍රී ලංකාවක් සඳහා එක්සත් ජනපදයේ කැපවීම වඩාත් සහතික කරනු ලබයි. ඒවාගේම එමගින් අපගේ දෙරට අතර පාර්ශවකරණය ශක්තිමත් කිරීමට සහ පවත්වාගෙන යාමට අප තුළ පවත්නා කැපවීම මනාව පිළිඹිමු කරනු ලබයි. ඔබ සියලු නැවත වතාවක් සාදරයෙන් පිළිගනිමින් ඔබට සුභපාර්ථනා කරන අතර ඔබ සියලු දෙනා විසින් ඉදිරි  දින කිහිපය තුළ සිදුකරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මගේ ස්තූතිය පුදකරමි. ඔබට ස්තූතියි